සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

හින්දු ශිෂ්ටාචාරය I
இந்து நாகரிகம் I
Hindu Civilization I

46 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, **එහි අංකය** උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි **කතිරයක්** (X) **යොදා දක්වන්න**.

---

**1.** ඍග් වේදයේ දෙවියන් සහ විශ්වය අතර සම්බන්ධතාවය තහවුරු කරන ගීතය වන්නේ,
(1) හිරු ගීතයයි. (2) නාසදීය ගීතයයි. (3) මිත්‍රන් ගීතයයි. (4) යමන් ගීතයයි. (5) උෂෛ ගීතයයි.

**2.** 'රිදම්' යන සොබාදහම පාලනය කර ආරක්ෂා කරනු ලබන ශක්තිය ලෙස වේදයේ ප්‍රශංසා කරනු ලබන දෙවියන් වන්නේ,
(1) අග්නි ය. (2) පූෂන් ය. (3) වරුණන් ය. (4) පර්ජන්යන් ය. (5) වායු ය.

**3.** ලෝකය නිර්මාණය කරනු ලැබුවේ 'සියුම් බ්‍රහ්මයෙන්' යැයි සඳහන් කරන ලද්දේ,
(1) කේන උපනිෂද්වල ය.
(2) ඓතරේය උපනිෂද්වල ය.
(3) මාණ්ඩූක්‍ය උපනිෂද්වල ය.
(4) සාන්තෝක්‍ය උපනිෂද්වල ය.
(5) කෞෂිතකි උපනිෂද්වල ය.

**4.** පාදරායණර් නමැත්තා විසින් රචනා කරන ලද උපනිෂද්වල සමූහයක් ලෙස තිබෙන ග්‍රන්ථය,
(1) බ්‍රහ්ම සූත්‍රයයි. (2) සුල්ව සූත්‍රයයි. (3) කල්ප සූත්‍රයයි.
(4) සුක්‍ර සූත්‍රයයි. (5) කිරුහ්ය සූත්‍රයයි.

**5.** වෛෂ්ණව ආගම්වල සම්ප්‍රදායන්ගෙන් එකක් වන්නේ,
(1) සූත්‍ර ය. (2) නිඝණ්ඩු ය. (3) පාන්චරාත්‍රම් ය.
(4) නිරුක්තම් ය. (5) කල්පම් ය.

**6.** ගෘහස්ථ ජීවිතය අනුගමනය කරන්නා විසින් කළ යුතු යුතුකම්වලින් දෙකක් සඳහන් කර ඇති වරණය වන්නේ,
(1) නිවාස ඉදිකිරීම හා ධනය ඉපයීම වේ.
(2) බ්‍රහ්මයඥම් හා තේවයඥම් වේ.
(3) මළවුන් පිදීම හා රුක් රෝපණය කිරීම වේ.
(4) සත්ත්ව වන්දනාව හා දිනපතා ස්නානය කිරීම වේ.
(5) දෙමාපිය වන්දනාව හා ඉගැන්වීම වේ.

**7.** මෙයිකණ්ඩ ශාස්ත්‍ර දාහතරකින් මැද තිබෙන ග්‍රන්ථය වන්නේ,
(1) කොයිට්පුරාණම් ය. (2) සිවඥානසිත්තියාර් ය.
(3) තිරුවුන්දියාර් ය. (4) සිවඥානපෝදම් ය.
(5) උණ්මෛ විලක්කම් ය.

[දෙවැනි පිටුව බලන්න.

**8.** මාමල්ලපුර ගණේෂර් දේවාලයේ ශිලා ලිපි මගින් තමා තුළ ඇති ශිවදෙවියන් පිළිබඳ ඉහළ භක්තිය ප්‍රකාශ කළ පල්ලව රජු වන්නේ,
(1) මාමල්ලන් ය.
(2) පරමේසුවරන් ය.
(3) මහේන්ද්‍රවර්මන් ය.
(4) විෂ්ණුවර්මන් ය.
(5) පළමුවැනි නරසිම්මන් ය.

**9.** 'වෛදිකනෙරි' යන්නෙහි අර්ථය කුමක් ද?
(1) පුරාණංගල් ප්‍රශංසා කරනු ලබන දේවමාර්ගය
(2) උපනිෂද් ප්‍රශංසා කරනු ලබන දර්ශන මාර්ගය
(3) බ්‍රහ්මසූත්‍ර ප්‍රසංශා කරනු ලබන ජීවන මාර්ගය
(4) වේද මුල් කරගත් ආගමික මාර්ගය
(5) ඉතිහාසය පදනම් කරගත් ජීවන මාර්ගය

**10.** පංචසිද්ධාන්තිකෙහෙ හා සම්බන්ධ වන්නේ,
(1) දර්ශනය ය. (2) විද්‍යාව ය. (3) සාහිත්‍යය ය. (4) නාට්‍ය ය. (5) නර්තනය ය.

**11.** 'සුක්‍රනාඩි' යනු
(1) වෛද්‍ය ග්‍රන්ථයකි. (2) ජ්‍යොතිශ්‍ය ග්‍රන්ථයකි. (3) ගණිත ග්‍රන්ථයකි.
(4) දාර්ශනික ග්‍රන්ථයකි. (5) සංගීත ග්‍රන්ථයකි.

**12.** පැරණි විශ්වවිද්‍යාල ස්ථාපිත කළ ස්ථාන වන්නේ,
(1) පාඨලීපුරය, අවන්ති හා උජ්ජේනි ය. (2) නාලන්දා, අවන්ති හා කාසි ය.
(3) උජ්ජේනි, කාසි හා පාඨලීපුරය ය. (4) කාසි, නාලන්දා හා අයෝධ්‍යා ය.
(5) අයෝධ්‍යා, අවන්ති, පංචාලි ය.

**13.** 'සර්වමූලම්' යනු
(1) ස්මිරුදිවල එකතුව ය. (2) කරුවි ග්‍රන්ථවල එකතුව ය.
(3) දාර්ශනික ග්‍රන්ථවල එකතුව ය. (4) කලා ග්‍රන්ථවල එකතුව ය.
(5) පත්තදිවල එකතුව ය.

**14.** 'අන් අයගේ යහපත් ක්‍රියාවන්හි සතුටුවීම' යන්න පෙන්වා දෙන බෞද්ධ කුසලය වන්නේ,
(1) ශීලය ය. (2) අපචායනය ය. (3) ධර්ම චේතනාව ය.
(4) අනුමෝදනා ය. (5) භාවනා ය.

**15.** වාල්මිකි රාමායණයෙහි පෙන්වා දෙන 'ශාවර්ණයකරණි' යන ඖෂධ පැළෑටිය,
(1) ඊතලය නිසා ඇති වූ තුවාල සුව කරයි.
(2) මියගිය අයට ජීවිතය ලබාදෙයි.
(3) පිළිස්සීමෙන් ඇති වූ තුවාල සුව කරයි.
(4) අස්ථි බිඳීම් සුව කරයි.
(5) ලේ ගලායාම පාලනය කරයි.

**16.** හින්දු ආගමික සම්ප්‍රදායේ 'පිඩාරර්හල්' යන අය,
(1) පාසුපදර්වරුන් ය.
(2) චිත්‍ර ශිල්පියා ය.
(3) වීරශෛව බැතිමතුන් ය.
(4) තලෛක්කෝලිවරුන් ය.
(5) තාලයට ගායනා කරන සංගීතඥයා ය.

**17.** බුදුදහම තහවුරු කරන පන්සිල්වලින් එකක් වන්නේ,
(1) පොළොවේ නිදා ගැනීම ය. (2) ආභරණ නොපැළඳීම ය.
(3) මත්පැන් පානය නොකිරීම ය. (4) හිටගෙන අනුභව කිරීම ය.
(5) ආගන්තුකයාට ප්‍රශංසා කිරීම ය.

**18.** බ්‍රහ්මයේ සූක්ෂ්ම ව්‍යාප්ත තත්ත්වය 'දර තුළ නොපෙනී තිබෙන ගින්දරට' උපමා කරන උපනිශද් වන්නේ,
(1) සාන්දෝක්‍ය උපනිශද් ය. (2) සුවේදාස්වර උපනිශද් ය.
(3) කෞශීතකි උපනිශද් ය. (4) කඩ උපනිශද් ය.
(5) පිරුකතාරණ්‍ය උපනිශද් ය.

**19.** මුල්ලෛ ප්‍රදේශයට අයත් දෙවියන් ලෙස සංග සාහිත්‍යවල ප්‍රශංසා කරනු ලබන්නේ,
(1) වරුණන් ය. (2) තිරුමාල් ය. (3) ඉන්ද්‍රන් ය.
(4) හිරු ය. (5) මුරුගන් ය.

**20.** ලෝකයේ අතිවිශාල හින්දු දේවාල ගොඩනැගිලි සමූහයක් ඇති රට වන්නේ,
(1) ඉන්දියාව ය. (2) කාම්බෝජය ය. (3) මැලේසියාව ය.
(4) ශ්‍රී ලංකාව ය. (5) නේපාලය ය.

**21.** හින්දු ශිෂ්ටාචාර ඉතිහාසයේ දෙවෙනි ස්වර්ණමය යුගය ලෙස පැවති විජයනගර යුගයේ රජවරුන්ගෙන් එක් අයෙකු වන්නේ,
(1) අපරාජිතයින් ය. (2) මාරවර්මන් ය. (3) කණ්ඩරාතිත්තන් ය.
(4) ක්‍රිෂ්ණ දේවරායර් ය. (5) සිම්ම විෂ්ණු ය.

**22.** 'හින්දු ඔළි' සඟරාව හා සම්බන්ධ වන්නේ,
(1) හින්දු සුයම් සේවා සමිතිය ය. (2) සමස්ත ලංකා හින්දු මාමන්රම් ය.
(3) විවේකානන්ද සභාව ය. (4) හින්දු දේවාලවල සමාගම් ය.
(5) හින්දු විදුහලේ අධිකාරි සභාව ය.

**23.** 'ආත්තිචූඩි' නමැති වෙණ්බා ගීතය ලියන ලද්දේ,
(1) භාරති විසින් ය. (2) ඖවෛයාර් විසින් ය. (3) රාමපාරති විසින් ය.
(4) පූහළේන්දි විසින් ය. (5) නක්කීරර් විසින් ය.

**24.** ඉන්දීය ගණිත විද්‍යාවේ මූලිකයින් තිදෙනා වන්නේ,
(1) ආර්යපට්ටර්, වරාහමිහිරර් හා ප්‍රමකුප්තර් ය.
(2) පාස්කරර්, ප්‍රමකුප්තර් හා පුළිසර් ය.
(3) පුළිසර්, ආරියපට්ටර් හා වරාහමිහිරර් ය.
(4) පාසකරර්, පුළිසර් හා වරාහමිහිරර් ය.
(5) බ්‍රම්මකුප්තර්, පාස්කරර් හා ආරියපට්ටර් ය.

**25.** "නුල් මුරෛ තෙරින්දු ඔළුහු" යැයි පැවසුවේ,
(1) ආරුමුගනාවලර් ය. (2) කුමරකුරුපරර් ය. (3) ඖවෛයාර් ය.
(4) මෙය්කණ්ඩදේවර් ය. (5) තිරුවල්ලුවර් ය.

**26.** දකුණු ඉන්දියාවේ ලෝහ වාත්තු පිළිමවල ස්වර්ණමය යුගය යැයි ප්‍රශංසා කරනු ලබන්නේ,
(1) විජයනගර නායක්කර් යුගය ය. (2) චෝල යුගය ය. (3) පල්ලව යුගය ය.
(4) පාණ්ඩිවරුන්ගේ යුගය ය. (5) චාලුක්‍ය යුගය ය.

**27.** විත්තුවසිරෝමණි න.ස. පොන්නම්බලප්පිල්ලෙ හා සම්බන්ධ වන්නේ,
(1) සෛවචින්තාමණි ය.
(2) සෛවවිත්තියාවිරුත්ති සංගමය ය.
(3) සෛවඋදයභානු ය.
(4) සෛවපරිපාලන සභාව ය.
(5) සෛවසමයසාරසංග්‍රහම් ය.

**28.** කායික හා මානසික නිරෝගීතාවයෙන් සම්බන්ධ වී තිබෙන දිනපතා පිළිපැදිය හැකි ක්‍රමය,
(1) වන්දනා ගමන් යාම ය. (2) පූජනීය ස්ථානවල දිය නෑම ය.
(3) සිල් අනුෂ්ඨාන කිරීම ය. (4) තෝප්පුක්කරණම් කිරීම ය.
(5) ප්‍රදක්ෂිණා කිරීම ය.

**29.** දේවාලවල ආගමික දේශනා පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වන්නේ,
(1) ජනතාව එක්රැස් කිරීම ය.
(2) තරුණ පරපුර වන්දනා මානවල නිරතකර වීම ය.
(3) අඛණ්ඩව වන්දනාමානයේ නිරත වූවන්ගේ ශාරීරික හා මානසික මළානිකකම නැති කිරීම ය.
(4) ආගමික දාර්ශනික අදහස් සරලව ජනගත කිරීම ය.
(5) ආගම වෙනස් කිරීම ය.

**30.** ශ්‍රී රාමක්‍රිෂ්ණ පරමහම්සර්ගේ සේවාවලින් ප්‍රධාන සේවාව වන්නේ,
(1) වේද උපනිශද් චින්තන හා හින්දු ආගමික වාදයක් ජනසතු කිරීම ය.
(2) සාක්ත ආගමික බැතිමතෙකු ලෙස සිටීම ය.
(3) සියලු ආගම් පිළිගැනීම ය.
(4) අනෙකුත් ජීවීන් ද තමාගේ ප්‍රාණයක් ලෙස සැලකීම ය.
(5) දේවාලයේ වන්දනාමානවල නිරතවීම ය.

**31.** යාපනයේ රජකළ ආර්ය චක්‍රවර්තීන්ගේ ලාංඡනයක් ලෙස පැවතියේ,
(1) ධර්ම චක්‍රය ය. (2) අලියා ය. (3) ගවයා ය.
(4) දුන්න සහ ඊතලය ය. (5) ආන්ජනේයර් ය.

**32.** මෙරට නැගෙනහිර පළාතේ සෛව ආගමික සේවාවන්වල නිරත වූ සෛව කවියා අරුණාසලතේසිගර් විසින් රචනා කළ ආගමික ග්‍රන්ථ අයත්වන කාණ්ඩය වන්නේ,
(1) තට්චිණකෛලාස පුරාණම් හා තිරුක්කරසෛ පුරාණම් ය.
(2) සෛව භූෂණ පරිහාරම් හා සෛව විනාවිඩෛ ය.
(3) කන්දපුරාණ වසනම් හා ඉලක්කණ සුරුක්කම් ය.
(4) සෛව ඉලක්කිය කදාමංජරී හා මෙය්ඥාන තීපම් ය.
(5) නඩරාජා වඩිවම් හා මහාලට්සුමී තෝත්‍රම් ය.

**33.** තිරුක්කේදීච්චරම් දේවාලයේ ඓතිහාසික විශිෂ්ටත්වය පවසන ග්‍රන්ථවලින් දෙකක් වන්නේ,
(1) සූද සංගිතෛ හා කෛලායමාලෛ ය.
(2) තේවාරප් පදිහම් හා තට්චිණකෛලාය මාන්මියම් ය.
(3) ඥානරත්තිනාවලි හා කෛලායමාලෛ ය.
(4) සරසෝදිමාලෛ හා මහාවම්සම් ය.
(5) යාල්පාන වෛපවමාලෛ හා ඥානරත්නාවලි ය.

**34.** තිරුකෝණේච්චර පූජනීය ස්ථානයේ තීර්ත්තම් වන්නේ,
(1) පාලාවි ය. (2) කෝයිට්තිරුක්කේණි ය.
(3) මායවන් ආරු ය. (4) පාවනාසම් ය.
(5) සමුත්තිර තීර්ත්තම් ය.

**35.** දේව පිළිම නිර්මාණය කිරීමෙහි නිපුණතාව සහිත වූ අය හඳුන්වන්නේ,
(1) සූත්‍රහිරාහි යන නමින් ය. (2) ස්තබදී යන නමින් ය.
(3) සිට්පක්කලෛඥන් යන නමින් ය. (4) වර්තහි යන නමින් ය.
(5) පුරෝහිදන් යන නමින් ය.

**36.** සංස්කෘතියේ සැකසීම් සහ පුනරුදයන් තීරණය කරන ප්‍රධාන සාධකය වන්නේ,
(1) අධ්‍යාපනයයි. (2) වන්දනා ගමනයි.
(3) කලා නිර්මාණයයි. (4) ආගමයි.
(5) ගුරුකුලයයි.

**37.** වෛෂ්ණව සම්ප්‍රදායෙහි විෂ්ණු දෙවියන් අවතාරය ගැනීමේ ප්‍රධානතම අරමුණ වන්නේ,
(1) භක්තිය වර්ධනය කිරීමට ය.
(2) හොඳ අය රකිමින් නරක අය විනාශ කිරීමට ය.
(3) දේවාලයේ පිළිමයක් ලෙසට වැඩ සිටීමට ය.
(4) ජනතාවට වන්දනා කිරීමටය.
(5) කලා විශිෂ්ටත්වය පෙන්වා දීමට ය.

**38.** රට සරු වී විශිෂ්ටත්වය ලැබීමට අදාළ පෞෂ්ටිකාණි මන්ත්‍රය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,
(1) ඍග්වේදය ය. (2) මහාභාරතය ය. (3) ආරණියහම් ය.
(4) අදර්ව වේදය ය. (5) ප්‍රාමණංගල් ය.

**39.** "මාව මරණයෙන් නොමැරෙන තත්ත්වයට ගෙන යනු මැනව" යන යාඥාව ඇතුළත් උපනිශද්,
(1) සාන්දෝක්‍යා උපනිශද් ය. (2) පිරුහතාරණ්‍යහ උපනිශද් ය.
(3) ඊෂාවාෂ්‍ය උපනිශද් ය. (4) කේන උපනිශද් ය.
(5) මුණ්ඩහ උපනිශද් ය.

Past Papers Wiki

**40.** සෛව සිද්ධාන්ත ශාස්ත්‍රවල පොන්නම්බලම් හි ඇති පඩි පෙළහි තබා ප්‍රශංසා කළ ග්‍රන්ථය වන්නේ,
(1) උණ්මෛ විලක්කම් ය.
(2) තිරුකලිට්රුපඩියාර් ය.
(3) තිරුවුන්දියාර් ය.
(4) සිවප්ප්‍රකාශම් ය.
(5) තිරුවරුට්පයන් ය.

- අංක **41** සිට **45** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති ප්‍රකාශ කියවා, එයට සුදුසු පිළිතුරු පහත වගුවේ සඳහන් **I, II, III, IV** යන තීරුවලින් තෝරන්න.

| I | II | III | IV |
|---|---|---|---|
| **A**<br>දේවාලය සඳහා වූ ස්ථානය සකස් කිරීම | **F**<br>දහම් මාර්ගයේ හැසිරෙන්න | **K**<br>සෝමන් | **P**<br>ආනන්දවනපූවනම් |
| **B**<br>සත්‍ය කතා කරත්වා | **G**<br>ආදරය මාර්ගයේ දේව වන්දනාව | **L**<br>කෝවිල්වල උත්සව පැවැත්වීම | **Q**<br>මව්පියන්ට දෙවියන්ට සේ සලකන්න |
| **C**<br>රුක්මිණී මංගලම් | **H**<br>පිරුදුවි | **M**<br>සත්පෝදම් යන දාර්ශනික ග්‍රන්ථය | **R**<br>පංච අක්ෂර මන්ත්‍රය ජප කිරීම |
| **D**<br>අග්නි | **I**<br>දේවාලයේ පිළිමයන් ස්ථාපිත කිරීම | **N**<br>අමුත්තන්ට දෙවියන්ට සේ සලකන්න | **S**<br>දේවාල පිළිවෙත්වල පවතින වැරදි නැති කිරීමේ පිළිවෙත් |
| **E**<br>පදිහම් ගායනා කිරීම | **J**<br>මදුරපාවම් | **O**<br>සිව සලකුණ ආරක්ෂා කිරීම | **T**<br>පිරුහස්පති |

**41.** සිවාගමංගල් පවසන කරුණු සමග සම්බන්ධ වන කාණ්ඩය කුමක් ද?
(1) **A, I, L, S** (2) **A, F, O, Q** (3) **B, F, O, R** (4) **C, H, M, S** (5) **D, G, K, Q**

**42.** උතුරු ඉන්දියානු භක්ති මාර්ගය සරු කළ මීරාභායි හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) **E, G, O, P** (2) **B, J, K, R** (3) **C, J, M, P** (4) **E, H, O, Q** (5) **D, F, M, T**

**43.** ගුරු කුල අධ්‍යාපනය අවසානයේ ගුරුතුමා ශිෂ්‍යයාට ලබා දුන් උපදෙස් හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) **A, H, M, Q** (2) **B, F, N, Q** (3) **C, J, L, T** (4) **E, J, O, S** (5) **D, J, L, T**

**44.** සෛව බැති ව්‍යාපාරයේ අය අනුගමනය කළ ආගමික විනය මාර්ග හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) **B, H, M, S** (2) **C, I, K, T** (3) **D, J, K, P** (4) **E, G, O, R** (5) **D, F, N, P**

**45.** ලෝකයට අයත් යැයි වේදවල පවසනු ලබන දෙවිවරුන්ගේ කාණ්ඩය කුමක් ද?
(1) **B, H, K, S** (2) **C, G, K, T** (3) **D, H, L, T** (4) **D, H, K, T** (5) **E, Q, M, P**

● අංක **46** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළව කිසියම් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. ඒවායින් මාතෘකාව හා **නොගැළපෙන** කරුණ තෝරන්න.

**46. නූතන හින්දු ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාර අතුරෙන් ආර්ය සමාජයේ කාර්ය භාර්ය සැලකිය යුතු එකකි.**

(1) වේද පදනම් කර ගත් ආගමික-විද්‍යා සම්බන්ධීකාරකය සඳහා සටනට කැඳවීම
(2) ආගමට හැරවීමට එරෙහිව මැනවින් සැලසුම් කරගත් ශාඛාවන් පිහිටුවීම
(3) බාල වයස් විවාහ හා කණවැද්දුම් ස්ත්‍රීන් නැවත විවාහ වීම සම්බන්ධව සමාජය දැනුවත් කිරීමේ උත්සාහයන්
(4) සති පූජා නීත්‍යානුකූලව තහනම් කිරීම
(5) අතනොතැබීම හා සමාජ සැකසුම් දෘෂ්ටිකෝණවලට එරෙහි ක්‍රියාකාරකම්වල නිරතවීම

**47. පල්ලව සහ පාණ්ඩ්‍ය කාලයේ දී හින්දු සංස්කෘතිය පෝෂණය වූයේ ය.**

(1) මුල් යුගයේ පල්ලව රජවරු වෛදික ආගම ඇදවූහ.
(2) දේවාල පදනම් කරගත් ගම් නැගීසිටියේ ය.
(3) පල්ලව පාලකයන්ගේ ආභාෂය පාණ්ඩ්‍ය රජවරුන්ට හිමි විය.
(4) පුරාණ ඉතිහාස කතාන්දර මෙම යුගයේ නොපැතිරුණේ ය.
(5) ශ්‍රමණ ධර්මයේ රජවරු ශෛව ආගම සහ වෛෂ්ණව ආගම්වලට සහයෝගය දැක්වූහ.

**48. සමකාලීන සන්නිවේදන සහ හින්දු ආගම**

(1) මාධ්‍ය බැති ගීතිකා සහ ආගමික දේශනාවලට සහාය වේ.
(2) මාධ්‍ය අතුරෙන් මුද්‍රිත කලාව විශිෂ්ට තැනක් ලබයි.
(3) සෑම කාලයක ම එක් එක් ආකාරයේ මාධ්‍ය නිසා හින්දු ආගම සංවර්ධනය වෙමින් පවතී.
(4) ශ්‍රී ලංකාවේ දේවාල උත්සව පිළිබඳව මාධ්‍යවලින් සන්නිවේදනයට විශේෂත්වයක් නොලැබුණි.
(5) භක්ති ගීත සම්බන්ධව සමකාලීන සන්නිවේදන හින්දු නිවෙස්වල ආගමික පරිසරය ඇති කරයි.

**49. ආත්ම අධිෂ්ඨානයේ ඉමහත් යහපත විමුක්තිය වේ.**

(1) මෙය මෝක්ෂය යනුවෙන් ද හඳුන්වනු ලැබේ.
(2) හින්දු ආගමෙහි සියලු ම පාර්ශ්වවලට අයත් අයට විමුක්තිය ලබා ගැනීම සඳහා වන ක්‍රමවේද ආගමික විද්වතුන් විසින් පවසා ඇත.
(3) දුක්වලින් නිරාවරණයවීම සත්‍ය විමුක්තිය වේ.
(4) විමුක්තිය ලබාගත් ආත්මයට පුනරුත්පත්තියක් නොමැත.
(5) ඖවෛයාර් යන කිවිඳිය විමුක්තිය පිළිබඳව තමාගේ ගීතිකාවල කිසිවක් පවසා නොමැත.

**50. ශ්‍රීලශ්‍රී ආරුමුග නාවලර් ශෛව ආගමටත්, දෙමළ භාෂාවටත් ඉමහත් සේවයක් සිදු කළ විද්වතෙකි.**

(1) නාවලර්තුමා නල්ලූර්වල 1882 වර්ෂයේ උපත ලැබී ය.
(2) දෙමළ, සංස්කෘත, ඉංග්‍රීසි යන තෛභාෂාවලින් පාණ්ඩිත්‍යය ලැබූ කෙනෙකි.
(3) ඔහුගේ ආගමික සේවය, අධ්‍යාපනික සේවය, සමාජ සේවය සහ මුද්‍රණය පිළිබඳ සේවය යනාදිය විශිෂ්ට තැනක් ගනී.
(4) මොහුගේ ආගමික සහ භාෂා කුසලතාවය සඳහා තිරුප්පනන්දාල් ආදීනම් 'නාවලර්' යන විරුදනාමය පිරිනමා ගෞරව කළේ ය.
(5) නාවලර්තුමා බ්‍රහ්මචාරි ජීවිතයක් ගත කළ කෙනෙක් ය.

* * *

AL/2024/46/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

හින්දු ශිෂ්ටාචාරය II
இந்து நாகரிகம் II
Hindu Civilization II

46 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

✳ **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** හින්දු ශිෂ්ටාචාර පුනරුදයට මහාපුරාණංගල්වල දායකත්වය පහත සඳහන් මාතෘකා ඇසුරෙන් පැහැදිලි කරන්න.

(අ) පුරාණංගල් පිළිබඳව හැඳින්වීම

(ආ) පුරාණංගල්වල සැකසුම් ක්‍රම

(ඉ) පුරාණංගල් පවසන වන්දනා සම්ප්‍රදාය

(ඊ) හින්දු ශිෂ්ටාචාර වර්ධනයේ පුරාණංගල්වල ආභාෂය (ලකුණු 05 × 4 = 20යි.)

**2.** චෝළ යුගයේ දේවාල ගෘහනිර්මාණ කලාව දකුණු ඉන්දියාවේ වර්ධනය වූ ආකාරය පහත සඳහන් මාතෘකා ඇසුරෙන් විස්තර කරන්න.

(අ) දේවාල ගෘහනිර්මාණ කලාවට දායකත්වය ලබාදුන් චෝළ රජවරුන් තිදෙනෙකු (ලකුණු 03යි.)

(ආ) පැරණි චෝළ දේවාල (ලකුණු 05යි.)

(ඉ) මධ්‍යකාලීන චෝළ දේවාල (ලකුණු 06යි.)

(ඊ) පසුකාලීන චෝළ දේවාල (ලකුණු 06යි.)

**3.** ශ්‍රී ලංකාවේ ශෛව ආගමටත්, ශෛව සිද්ධාන්ත පුනරුදයටත් ශෛව විද්වතා වන කාසිවාසි සෙන්දිනාදෛයර් කළ සේවාවන් පිළිබඳව පහත සඳහන් මාතෘකා ඇසුරෙන් පරීක්ෂා කරන්න.

(අ) ඔහුගේ ජීවිතය පිළිබඳ හැඳින්වීම (ලකුණු 04යි.)

(ආ) ශෛව ආගම සහ ශෛව සිද්ධාන්තය සම්බන්ධව ඔහුගේ සේවාවන් (ලකුණු 08යි.)

(ඉ) ආගමික ග්‍රන්ථ හා සම්බන්ධ සේවය (ලකුණු 08යි.)

## II කොටස

**4.** අත්වෛද වේදාන්තය සම්බන්ධව පහත සඳහන් කරුණු පැහැදිලි කරන්න.

(අ) 'කේවල අත්වෛදම්' යන්නෙහි අර්ථය පහදාදීම (ලකුණු 04යි.)

(ආ) අත්වෛදම් පිළිගන්නා ප්‍රමාණ (මිනුම්) (ලකුණු 04යි.)

(ඉ) ප්‍රතිබිම්බ වාදය (ලකුණු 06යි.)

(ඊ) විවර්ථ වාදය (ලකුණු 06යි.)

**5.** ශෛව සිද්ධාන්තයෙහි ඇති ආත්මය පිළිබඳ සිතුවිලි පහත සඳහන් මාතෘකා ඇසුරෙන් විස්තර කරන්න.

(අ) ආත්මයේ ස්වභාවය (ලකුණු 04යි.)

(ආ) ආත්මය සහ ත්‍රිමල (ලකුණු 06යි.)

(ඉ) ආත්මය තැන්පත්වීමට අයත් ක්‍රමවේද සහ ආත්ම විමුක්තිය (ලකුණු 10යි.)

**6.** හින්දු ශිෂ්ටාචාර ඉතිහාසයේ 'වෛද්‍ය විද්‍යාවේ ගමන්මග' සුදුසු සාක්ෂීන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 20යි.)

**7.** ශිව දේවාලවල තැන්පත් කර ඇති නඩරාජා දේව ප්‍රතිමාවේ විශේෂිත ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 20යි.)

**8.** පැරණි හින්දු ජනයාට ආරක්ෂා සහිතව හා විනයානුකූලව තම සමාජ ජීවිතය ගත කිරීමට සහාය වූ එකල පැවති දේශපාලන ක්‍රම පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 20යි.)

* * *